කිසිදු පිළිගත හැකි මූලාශ්‍රයකින් තොරව යම් කිසි පුවතක් මාධ්‍යයක පළ වන්නේ නම්, ඔබට එය කෙතරම් දුරට විශ්වාස කළ හැකිද?

මාධ්‍ය ආචාර ධර්ම පවසන්නේ, මූලාශ්‍රය මගින් සිය අනන්‍යතාවය ආරක්ෂා කරනා ලෙසට ඉල්ලා සිටීම වැනි සුවිශේෂී අවස්ථාවකදී හැරෙන්නට, යම් පුවතක් වාර්තා කිරීමේදී මූලාශ්‍ර භාවිතා කිරීම සාමාන්‍ය භාවිතය විය යුතු බවයි. පුවතක විශ්වසනීයත්වය ඉහළ නැංවීමට මූලාශ්‍ර අත්‍යවශ්‍ය වේ.
කෙසේ නමුත්, ජිනීවා හි පැවැත්වෙන 51 වෙනි මානව හිමිකම් කවුන්සිල සැසිවාරයට ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගෙන ආ යෝජනාවේ අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ හමුදා නිලධාරීන් 58 දෙනෙකුට එරෙහිව ජාත්‍යන්තර නීතිය සම්මත කිරීම බවට පුවතක් දිවයින පුවත්පතේ (ඔක්. 07, 2022) පළ වන්නේ කිසිදු මූලාශ්‍රයක් නොමැතිවයි.

මෙම පුවත කෙතරම් දුරට විශ්වසනීය යැයි ඔබ සිතන්නේ ද?

නිවැරදි මූලාශ්‍ර සමඟින් නිවැරදි පුවත් වාර්තා කරමු!

මූලාශ්‍ර:
https://www.afp.com/.../12_april_2016_afp_ethic_final.pdf...